# ධර්ම රාජ්‍යයක් උදෙසා වූ ප්‍රතිපත්ති පූජාව

දයාබර මිතුරනි,

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ, ශ්‍රී සද්ධර්මය, මහා සංඝ රත්නය අනුබුදු මිහිඳු මාහිමියන් විසින් අපට දායාද කල අග්‍ර මහා දායාදයයි. මේ ශ්‍රී ලංකාද්වීපය බුදු දහමෙන් පෝෂණය වුනු ශ්‍රේෂ්ඨ උරුමයකට හිමිකම් කියන්නකි. ඒ අති උත්තම වූ සද්ධර්මය මේ සා කාලයක් රැකගෙන ආවේ ජාතියේ මුර දේවතාවුන් වහන්සේලායි.

උන් වහසේලා ජරා ජීර්ණ දේශපාලනය නම් මඩ ගොහොරුවට බැස ඇත. එවන් වූ දුගඳ හමන මඩ ගොහොරුවක අපේ ජාතියේ මුර දේවතාවුන් වහන්සේලා එරී යාවීදෝ යන බිය අප හදවත් තුල ගැබ්ව ඇත. එයට හේතුව වර්ථමාන රට තුල ඇති දූෂිත දෙශපාලන සංස්කෘතිය අප සිත් සතන් තුල ඔබ්බවා ඇති පිළිකුල් සහගත ආකල්පයයි. එනමුත් ඒ දුගඳ හමන මඩ ගොහොරුවේ සුපිපෙන නෙළුම බවට මුර දේවතාවුන් වහන්සේලා පත්වනු නොඅනුමානය.

වසර 2500 කට අධික කාලයක් අපගේ නුවණැස පෑදූ අති උත්තම වූ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම ඉතිරිව ඇති පැරණිම රාජ්‍යය මේ කුඩා දිවයිනයි. ත්‍රිවිධ රත්නයන්ගෙන් තෙවන රත්නය වන ගරුතර මහා සංඝ රත්නය වෙත එය සුරැකීමේ බාරදූර වගකීම පැවරී ඇත. මේ සා කාලයක් තුල උන් වහන්සේලා ජීවිත පරිත්‍යාගයෙන් එය අපට දායාද කර ඇත. ඉදිරියටත් එය එසේම රැක ගැනීම උන් වහන්සේලාගේ පරම යුතුකමයි. ඒ යුතුකම ඉටු කරනු වස් උන් වහන්සේලා නැවතත් රට, ජාතිය, හා ආගම වෙනුවෙන් ඉදිරියට පැමිණ ඇත.

"මනෝ පුබ්බං ගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝ මයා
මනසා චේ පසන්නේන - භාසතීවා කරෝති වා
තතෝ නං සුඛ මන් වේතී - ජායාව අන පායිනී"

"මනස සියල්ලන්ටම පෙරටුව ගමන් කරයි. යහපත් සිතින් යමක් පවසයිද කරයිද, තමා පසුපස එන සෙවනැල්ල මෙන් සැපයම අත් වෙයි"

එසේ නම් මෙම ආගමනයේ ධර්මානුකූල බව හා විනයානුකූල බව සක් සුදක් සේ පැහැදිලිය.

අප උරුම කම් කියන මේ බුදු සසුන ඉතිහාසයේ බොහෝ තර්ජන හා බාධක වලට මුහුණ දුන්නකි. අප රට පහල වූ ශ්‍රේෂ්ඨ වීරයෙකු ලෙස අදත් සලකන දුටුගැමුණු රජතුමන්ගේ කාලයේ අභය හිමියන් සිවුරු හැර දමා යුද බිමට බටුයේ ජාතිය රැක ගැනීම කාලීන අවශ්‍යතාවක් වූ නිසාය. වෙරළුත්තාභයන් ඉන් පසු නැවත සසුනට පිවිස නිවන් අවබෝධ කර ගත්හ.

වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ පංච මහා වාද අපට ඇසෙන්නේ සිංහල බෞද්ධයා තලා පෙලා තිබූ යුගයකය. උන් වහන්සේගේ වාදයන් ඉතා දැඩි වූ අතර කාලීන අවශ්‍යතාවයන් මත උන් වහන්සේ කටයුතු නොකලේ නම් බුදු දහම මෙරටින් තුරන් වී යෑමට ඉඩ තිබුනී. කර්නල් හෙන් රී ඔල්කොට් තුමන්ගේ මෙරට ආගමනය කෙතරම් බුදු දහමේ පැවැත්ම උදෙසා බලපෑවේද යන්න අප කවුරුත් දන්නා කාරණයකි.

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්, ටිබෙට් ජාතික ඇස් මහින්ද හිමියන් ආරණ්‍ය ගතව සිල් රැක්කා නම් අප රටට සිදු වූ ව්‍යසනයන්ගෙන් රට හා ජාතිය වඳ වී යෑමට ඉඩ තිබුනි. දිවි නොතකා උන් වහන්සේලා කළ කැප වීම අපට අමතක කළ නොහැක.

එසේ නම් මේ තීරණාත්මක අවස්ථාවේදී  සාම්ප්‍රදායික රටාවෙන් බැහැර වීමට අපගේ නොමඳ ගෞරවයට පාත්‍ර වන එල්ලාවල මේධානන්ද හිමියන්, ඕමල්පේ සෝභිත හිමියන්, උඩුවේ ධම්මලෝක හිමියන්, කොළොන්නාවේ සුමංගල හිමියන්, අතුරලියේ රතනසාර හිමියන්, කොටපොල අමරකිත්ති හිමියන් ඇතුලු මහා සංඝ රත්නය ගත් තීරණය අප කිසිවෙකුට සුළු කොට තැකිය නොහැක. කූට, දුෂ්ඨ දේශපාලකයන්ට කරන අනුශාසනා කන පිට හැරවූ කළයකට දමන දිය මෙන් බව උන් වහසේලා අවබෝධ කරගෙන ඇත.

**මෙය ප්‍රසිද්ධ ස්ථාන වල ඇලවීම තහනම්**

සෝම හාමුදුරුවනේ, ඔබ වහන්සේ ජීවමානයි අපේ හාමුදුරුවනේ. ඔබ වහන්සේ අප හැර දා යනවිට අප තොලග රැව් දුන්නේ "අපි අසරණ වෙලා වගෙ හිතට දැනෙනවා බුදු හාමුදුරුවනේ" යන ගී පද වැලයි. නමුත් මේ බුද්ධ පුත්‍රයන් අප තනි කර දමා නෑ. එදා මෙන්ම අදත් මහා සංඝ රත්නය අපේ ජාතිය ආගම වෙනුවෙන් පෙරට ඇවිල්ලා. දිවි පරදුවට තබා පෙරට ඇවිල්ලා. අප තවමත් අසරණ වෙලා නෑ. අපට තව අවස්ථාවක් ලැබිල තියෙනවා සෝම හාමුදුරුවනේ.

බුදුරජාණන් වහන්සේ තරම් දේශපාලඥේඥයෙක් මෙලොව පහළ වී නැහැ. උන් වහන්සේ තරම් ආර්ථික විද්‍යාඥයෙක් මෙලොව පහළ වී නෑ. බුදුරජාණන් වහසේගේ දහම තරම පරිපූර්ණ වූ දහමක් මෙලොව පහළ වී නෑ. ඒතරම් අවිහිංසාවාදී දහමක්, එතරම් නිවහල් දහමක් මෙලොව පහළ වී නෑ.

එසේ නම් ඒ සාර වූ දහම් මාවතේ ඇදෙන පාරමිතා පෙරහර මෙරට සියළු ආගම් සියළු ජාතීන්ට විමුක්තිය ලබා දෙන්නකි. සෑම ආගමිකයෙකුගේම, සෑම ජාතිකයෙකුගේම අයිතීන් තහවුරු කරන්නකි. ධර්ම රාජ්‍යයක් තුල තිරිසන් සතෙකුට පවා හිංසාවක් වෙන්නෙ නෑ. ගහ කොල පවා ධර්ම රාජ්‍යය තුල සුවෙන් වැජඹේවි. ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම නායකයා වූ ධර්මාශෝක අධිරාජ්‍යයා බිහි කළේ බෞද්ධ ධර්ම රාජ්‍යයක්. ඒ ධර්ම රාජ්‍යයට මග පෙන්වූයේ නිග්‍රෝධ සාමනේරයන් වහන්සේයි.

එසේ නම් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පෙරටු කරගෙන, ශ්‍රී සද්ධර්මයේ සුරක්ෂිත බව උදෙසා සහ ශ්‍රී ලංකාද්වීපයේ ඒකීය භාවය උදෙසා, සැරියුත් මුගලන් අගසව් දෙනම ඇතුලු අසූ මහා ශ්‍රාවකයන්ගෙන් පැවත එන, අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගෙන් පැවත එන, තේරපුත්ථාභය හිමියන්, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්, ටිබෙට් ජාතික ඇස් මහින්ද හිමියන්, මිගෙට්ටුවතේ ගුණානන්ද හිමියන්, ගංගොඩවිල සෝම හිමියන්ගේ දා බිඳු වලින් සුවඳවත් වන, වාරියපොල සුමංගල හිමියන් ඉංග්‍රීසි කොඩිය බිම දමා අප ජාතික කොඩිය එසවූ දිනෙන් පටන් ගත් ධර්ම රාජ්‍යයක් උදෙසා වූ පාරමිතා පෙරහරේ නියමුවන් වූ ගරුතර මහා සංඝ රත්නයට, අපගේ ප්‍රතිපත්ති පූජාව පුද කරමු.

# ඔබ සැමට තෙරුවන් සරණයි !



***<u>ශ්‍රී ලාංකීය අන්තර්ජාල එකමුතුව</u>***

- *www.BodhuSisila.Net - In the Name of Soma Thero - "සෝම හිමියන්ගේ නාමයෙන්" අන්තර්ජාල එකමුතුව*
- *http://jyotisha.00it.com - හෙළ සිරිත් විරිත් රැක ගැනීම, සහ ලෞකික ලෝකෝත්තර දියුණුව සඳහා සෝම හිමියන් පෙන්වූ මග දක්වන ඕස්ට්‍රේලියාවේ සිට පළකරන සිංහල වෙබ් අඩවිය*
- *http://www.amarasara.net/jhu/ - අමරසර වෙබ් අඩවිය*
- *sinhalayo@yahoogroups.com - සිංහලයෝ අන්තර්ජාල එකමුතුව*
- *sinhalaminds@sinhalaya.com - සිංහල බෞද්ධ උරුමය සුරැකීමේ අන්තර්ජාල ගවේෂකයන්ගේ එකමුතුව*

~ මෙම පණිවිඩය ඔබේ සියලු මිතුරන් හා හිතවතුන් අතර බෙදා හරින මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු ~

මෙය ප්‍රසිද්ධ සිථාන වල ඇලවීම තහනම්